සැ. යු. -2020.04.03 අංක 2170, 2020.04.09 අංක 2171, 2020.04.17 අංක 2172, 2020.04.24 අංක 2173, 2020.04.30 අංක 2174, 2020.05.06 අංක 2175, 2020.05.15 අංක 2176 සහ 2020.05.22 අංක 2177 යන ගැසට් පත්‍ර Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් පළ නොවූ බව දන්වා සිටිනු ලැබේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,178 - 2020 මැයි මස 29 වැනි සිකුරාදා - 2020.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 596 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 602 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජූනි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජූනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## විශේෂ නිවේදනයයි

**Covid - 19** වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ ක්‍රියාත්මක නිරෝධායන කටයුතු නිසා 2020.03.16 දින සිට 2020.05.11 දින දක්වා රාජ්‍ය හා පෞද්ගලික ආයතන විවෘත කර නොතිබූ බැවින් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කිසිදු නිවේදනයක් රජයේ මුද්‍රණාලයට නොලැබුණි.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

කෝට්ටමුනේ TT-2 රා තැබෑරුම් රේන්ද විකිණීම

**2020 ජූලි 2021 ජුනි**

1982.08.20 වන දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝට්ටමුනේ රා තැබෑරුම් 2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වන දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී බාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා සහභාගී විය යුතුයි.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් පන්සීයක (රු.500) මුදල මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් නමින් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත සහ වටිනාකම් සහතිකය ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත්‍රය ලබා ගත හැක. ටෙන්ඩර් පත සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත නිකුත් කරනු ලබන්නේ 2020.06.01 වන දින සිට 2020.06.15 වන දින පස්වරු 3.00 දක්වා

2. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතිකය ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතුයි. මෙම වටිනාකම් සහතිකයේ මුල්පිටපත ටෙන්ඩර්පත්‍ර සමග අමුණා තිබිය යුතු අතර මෙම වටිනාකම් සහතිකය සමග ඉඩම් රෙජිස්ට්‍රාර්තුමා විසින් ලබාදෙන ඉඩම් ලේඛන සටහන් ලසු පිටපත් අමුණා තිබිය යුතුයි. (මෙම ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පටන් ගත් දිනයෙන් පසුව ලබාගත යුතුයි.)

3. ටෙන්ඩර්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරය තුළ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල පිටපත තව ලිපි කවරය තුළ බහා එම කවරය අලවා ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් ඉහත 2 වැනි සටහන් අනුව ලේඛනය අමුණා නොමැති නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර, ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යනම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුල ඔබ ලබා ගත් ටෙන්ඩර් පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

6. තැබෑරුම් දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයෙත් අඛණ්ඩව තිබේ දැයි සහතික කළ නොහැක.

7. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගිවන්නේනම්, සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර, දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා රා තැබෑරුම බදු ගෙවා පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතුයි.)

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. වාසුදේවන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ උතුර, මඩකලපුව.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මඩකලපුව මහනගර සභා මායිම් තුල | TT2 | 2020.06.15 | පස්වරු 3.00 |

සටහන.-

01. ටෙන්ඩර් මණ්ඩලය 2020.06.15 වන දින පස්වරු 3.00 ට රැස්වේ.

02. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2020.06.22 වන දින පස්වරු 3.00 ට රැස්වේ.

05-02

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2020/2021 වර්ෂය**

(2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා)

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ප්‍රසම්පාදන පත්‍රයකම ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ "අංක.................................... දරන......................................... රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන්" උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.22 වැනි දින පෙ.ව. 10.00 ට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2020.06.22 වැනි දින පෙ.ව. 10.00 ට ප්‍රසම්පාදන පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථකම ගැණුම්කරු විසින් මාස 02 කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනම ගෙවිය යුතු ය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2020.06.22 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2020 ජුනි මස 26 වැනි දින පෙ. ව. 10.00 දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදනපත් භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදළ වන බව ද සැලකිය යුතු ය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත්,
ත්‍රිකුණාමලය.

2020 මැයි මස
ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය පළාත* | *විවෘත කරන වේලාව* | *වසන වේලාව* | *ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* | *ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01 | කො. අංක 01 | විල්ලුන්ඩි අංක 01 | පෙ.ව. 11.00<br>ප. ව. 5.00 | ප.ව. 2.00<br>ප. ව. 8. 00 | 3,000 | 1,000 |
| 02. | තෙක්කලුත්තු තඹලගමුව | තෙක්කුලුත්තු අංක 03 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 1,500 | 1,000 |

05-42

---

## මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම
- 2020/2021 වර්ෂය

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව, එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

(2) සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් කළයුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

(3) විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනත වම් කෙළවරෙහි "අංක.......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන්, පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.29 දින පෙ.ව. 10.30 ට පෙර මහවැව ප්‍රාදේශීය ලේකම් ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

(4) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(5) 2020.06.29 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

(7) මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.
(දුරකථන අංකය : 032 -2254231, 0322252061).

එච්. එම්. නදීජා හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

2020 මැයි මස 22 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහවැව.

**උපලේඛනය**

| *රා තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|
| 16 | අඩප්පරගම | 500 0 |
| 17 | මට්ටාකොටුව | 500 0 |
| 18 | තොඩුවාව (උතුර) | 1,000 0 |

04-48

---

**පුත්තලම දිස්ත්‍රික්කය**

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

**රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020/2021 වර්ෂය**

***2020.07.01 සිට 2021.06.30 දක්වා***

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2020.06.24 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් භාරගනු ලැබේ.

02. ඔබගේ ටෙන්ඩරය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රයක සකස් විය යුතු අතර නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද අදාළ ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුන් වම් කෙළවරේ ''අංක 01 මුදුකටුව රා තැබෑරුම'' හෝ ''අංක 02 කටුනේරිය රා තැබෑරුම'' සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි රා තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.24 වැනි දින පෙ.ව.10.30 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2020 ජුනි මස 24 වැනි දින පෙ.ව.10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. (032 - 2254486)

ඩී. එම්. ආර්. පී. දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2020ක් වූ මැයි මස 22 වැනි දින,
නාත්තන්ඩිය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

*උපලේඛනය*

| *තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු.* |
|---|---|---|
| 01. | මූදුකටුව | 1,000.00 |
| 02. | කටුනේරිය | 1,000.00 |

05-54

---

**මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020/2021 වර්ෂය - 2020 ජූලි මස 01 සිට 2021 ජුනි මස 30 දක්වා කාලය සඳහා - මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ අංක.................................... දරන......................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2020.06.30 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2020.06.30 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032-2052271).

ජේ. ඒ. විජානි වසන්තිකා ,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2020 මැයි මස 22 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත |
|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.06.30<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 02. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.06.30<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 03. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.06.30<br>පෙ.ව.10.30 | 1,000 0 |
| 04. | මුන්දලම | උඩප්පුව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2020.06.30<br>පෙ.ව.10.30 | 1,000 0 |

05-53

---

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - වෙන්නප්පුව**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020/2021

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්වන කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක සකස් විය යුතු වන අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක .......................... දරන .............................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ පරිදි තැබෑරුම් අංකය සහ නම සඳහන් කොට 2020 ජුනි මස 11 වැනි දින සිට ජුනි 25 දින දක්වා 2020 ජුනි 25 වැනි දින පෙ. ව. 10.30 ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට, පෙර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පනවා ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙන්* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකුල විය යුතු ය.

05. 2020.06.25 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් හෝ නිසි පරිදි බලයලත් නියෝජිතයින් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(0315679170)

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 1 | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තඹරවිල | 2020.06.25 පෙ.ව. 10.30 | 500 0 |
| 2. | එම | නන්පුන්ඩන්කරය | එම | 250 0 |
| 3. | එම | වයික්කාල | එම | 1,000 0 |
| 4. | එම | බොරලැස්ස | එම | 500 0 |
| 5. | එම | දුම්මලදෙනිය | එම | 1,000 0 |
| 6. | එම | උල්හිටියාව | එම | 500 0 |
| 7. | එම | ලුණුවිල | එම | 500 0 |
| 8. | එම | වෙන්නප්පුව | එම | 2,000 0 |
| 9. | එම | නයිනමඩම | එම | 1,000 0 |

| *තැබෑරුම් විවෘත කරන වේලාව -* | *තැබෑරුම් වැසිය යුතු වේලාව* |
|---|---|
| පෙ. ව. 11.00 | ප. ව. 2.00, |
| ප. ව. 5.00 | ප. ව. 8.00. |

05-50

---

# රජයේ නොවන දැන්වීම්

**ණය හිමියන්ගේ රැස්වීම**

අයිඑස්එම් ඊකොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

(ලියාපදිංචි අංකය PV 00211249)

2007 අංක 7 දරන සමාගම් පනතේ 334 වැනි වගන්තියට ප්‍රකාරව සමාගම ස්වේඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා අයිඑස්එම් ඊකොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ණය හිමියන්ගේ රැස්වීම 2020 ජුනි මස 9 වැනි දා ප. ව. 3.00 ට පැවැත්වේ. මෙම අතත්‍ය රැස්වීම සඳහා සහභාගිවීමට කැමති සියලුම ණය හිමියන් තමන්ගේ හිමිකම්වල නියමිත වටිනාකම සහ එම හිමිකම්වල පදනම adminlegal@ism.nl යන විද්‍යුත් ලිපිනයට 2020 ජුනි මස 7 වැනි දා ප. ව. 3.00 ට හෝ ඊට පෙර ලබා දීමෙන් මෙම රැස්වීම සඳහා ආරාධනාවකට හිමිකම් ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි එස් එම් ඊ කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්.

05-22

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම 2020.03.05 වැනි දින සිට වෙනස්වීම මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ කලින් නම : රේඩියස් ප්‍රමෝෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අලුත් නම : ලොජිටෙක් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 120750
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 275, වනවාසළ පාර, කැළණිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-20

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම 2020.03.11 වැනි දින සිට වෙනස්වීම මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ කලින් නම : වෙස්ට්ගේට් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ගාන්ධාර ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107520
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 28, ස්ට්‍රැට්ෆෝර්ඩ් ඇවනිව්, කොළඹ 06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-19

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීමේ නිවේදනය

මහනුවර, පේරාදෙණිය අංක 396/12C හි දී පදිංචි ඇන්ටනීටා මෙඩෝනා ජෝෂප් මහත්මිය (ජා. හැ. ප. අංකය 576911890 V) වන මා විසින් මඩකලපුව, මායිම් පාර, 1 වැනි හරස් වීදිය, අංක 37/17 හිදී පදිංචි පුහලේන්දිරන් මයුරන් මයා (ජා. හැ. ප. අංකය 873550260 V) වෙත ලබාදෙන ලද ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියාන්ති වේල්මුරුගු මෙනවිය විසින් සහතික කරන ලද අංක 01 දරන හා 2019.06.17 දිනැති නැගෙනහිර පළාත, මඩකලපුව දිස්ත්‍රික්කය, කෝරළේ පත්තුව, කරුවාක්කේර්ණි හිදී පිහිටා ඇත ඉඩම සඳහා වූ මඩකලපුව සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ Serial No. E 104, Folio No. 13, Volume No. 27 හි 2019.07.02 දින ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලය අද දින සිට නීතියානුකූලව අවලංගු කරන බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත හා ප්‍රජාව වෙත දන්වා සිටින අතර මින් ඉදිරියට ඔහු සම්බන්ධයෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් මා වග නොකියන බව දන්වා සිටිමි.

ඇන්ටනීටා මෙඩෝනා ජෝෂප් මහත්මිය.

05-40

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.